**පොරතිවුපත්තු ප්‍රාදේශීය සභාව - 2022**
**-----------------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පොරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයට අදාල හිඟ මුද්දර ගාස්තු රු.11,233,307 ක් සමාලෝචිත වර්ෂයේදී අය කර තිබුණද, මෙම මුදල නැවතත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හිඟ හිටි ලෙස දක්වා තිබුණි. | දෝෂයකින් දක්වා ඇති හිඟ මුදල නිවැරදි කිරීමට පියවර ගෙන ඇති බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගබඩා තොගය රු. 1,733,098 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | තොගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිවලින් සභාවට ලැබිය යුතු රු.521,438 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබුණු රු.220,411 ක පොත් සහ ලිපි ද්‍රව්‍ය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | -එම- |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.48,538,599 ක් වටිනා ගිණුම් ශේෂ 05 ක් ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය සහ අයිතිය තහවුරු කිරීමේ ලියවිලි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ලිඛිත සාක්ෂි ලැබී තිබූ ඒවාට වත්කම් ලේඛනයේ ලේඛනගත කර ඇත. එසේ වුවත්, එහි තථ්‍ය වටිනාකම ලේඛනවල දැක්වීමට පියවර ගෙන ඇති බව. | වත්කම්වලට අදාල ලිපිලේඛන රැස්කර ලෙජරයේ ඇතුළත් කිරීමට පියවර ගත යුතුය. |

## 1.6 අනුකූල නොවීම්

### 1.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ I පරිච්ඡේදයේ 5 වගන්තියේ (XII) රීතිය | මුදල්, ගබඩා භාණ්ඩ, රජයට අයකර ගැනීම් සහ චෙක්පත් අත්සන් කිරීම වැනි රාජකාරී පවරා ඇති නිලධාරීන්ගෙන් ආරක්ෂිත ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. | ආරක්ෂිත ඇප තැන්පතු ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | නිලධාරීන්ගෙන් ආරක්ෂිත ඇප තැන්පතු ලබා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,840,744 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.35,954,444 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i) | වරිපනම් හා බදු | 1,200,000 | -- | -- | -- | 1,000,000 | -- | -- | -- |
| ii) | කුලී | 1,930,000 | 888,000 | 764,850 | 436,152 | 1,430,000 | 1,027,410 | 1,088,150 | 313,002 |
| iii) | බලපත්‍ර ගාස්තු | 1,905,000 | 1,080,625 | 1,080,625 | -- | 1,925,000 | 884,515 | 884,515 | -- |
| iv) | වෙනත් ආදායම් | 19,865,000 | 45,333,421 | 42,381,478 | 2,969,842 | 74,570,000 | 52,473,938 | 52,473,928 | 17,899 |
| | | 24,900,000 | 47,302,046 | 44,226,953 | 3,405,994 | 78,925,000 | 54,385,863 | 54,446,593 | 330,901 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දක්වා ඇත.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | 2013 අගෝස්තු 31 දිනැති අංක 1826 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාරව, ග්‍රාම සේවක වසම් 12ක් සංවර්ධිත ප්‍රදේශ ලෙස නම් කර ප්‍රකාශයට පත්කර තිබූ නමුත්, එම ප්‍රදේශවල පිහිටි දේපළ තක්සේරු කර වරිපනම් බදු අයකිරිමට පියවර ගෙන නොතිබුණි. | වරිපනම් බදු අයකිරීමේ මූලික පියවර ලෙස වර්තමානයේ තොරතුරු රැස්කරමින් පවතින බව. | වරිපනම් බදු අය කිරිමට පියවර ගත යුතුය. |
| (ආ) | **කුලී** | | |
| | 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂ අවසානය දක්වා පැවැති හිඟහිටි බදු කුලී රු.281,591ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පසුගිය කාලයට අදාල හිඟ හිටි අයකර ගැනිමටත්, ඒවා නොගෙවන අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් නියමිත බව. | හිඟහිටි බදුකුලී අය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂයේදි ව්‍යාපාරික ස්ථාන 66කින් ලැබිය යුතු වෙළෙඳ බලපත්‍ර ගාස්තු ආදායම් රු.123,900ක් සභාවට අහිමි වී තිබුණි. | ඉදිරි වර්ෂයේ දී නියත වශයෙන්ම බලපත්‍ර ගාස්තු අයකර ගැනිමට පියවර ගෙන ඇති බව. | වර්ෂයට අදාල වෙළෙඳ බලපත්‍ර ගාස්තු නිෂ්චිතවම අය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | **මුද්දර ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් හා අනෙකුත් නිළධාරීන්ගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.2,602,426 ක් විය. | පිළිතුරු ලබාදී නොමැත. | හිඟහිටි මුද්දර ගාස්තු ආදායම් ගෙන්වා ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් දුරකථන සම්න්ධතා 03ක් භාවිතා කර නොතිබූ නමුත්, සමාලෝචිත වර්ෂයේදී රු.87,060 ක ගාස්තු ගෙවා තිබුණි. | සභාවට අයත් භාවිතයකින් තොරව පවතින දුරකථන සම්බන්ධතාවන් විසන්ධි කිරීමට පියවර ගැනීමට නියමිත බව. | ඵලදායී නොවන සේවා සඳහා වන අමතර වියදම් වළක්වා ගැනිමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1992 සැප්තැම්බර් 30 දිනැති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශයට පත්කළ අංක 1769 දරන පොදු චක්‍රලේඛය ප්‍රකාරව, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකුට සැලැසුම් නිර්මාණ කළ හැක්කේ තනි මහල් ගොඩනැගිල්ලකට පමණක් වුවත්, සමාලෝචිත වර්ෂය තුළ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් අඳින ලද දෙමහල් ගොඩනැගිලි 05 ක සැලැසුම්, සභාව විසින් අනුමත කර තිබුණි. | මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් මහල් 02ක ගොඩනැගිලි සැලැසුම් නිර්මාණය කිරීමේ අවස්ථාවේදී එය විධායක ඉංජිනේරුවරයා අත්සන් කර පිළිගන්නා බව තීරණය කරන ලද බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අනවසර ගොඩනැගිලි 04 ක් සම්බන්ධයෙන් සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | අනුමැතිය ලබා නොගත් ගොඩනැගිලිවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇති බව. | අනුමැතිය රහිතව ඉදිකරන ගොඩනැගිලිවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | නැගෙනහිර පළාත් පශුසම්පත් නිෂ්පාදන දෙපාර්තමේන්තුවෙන් කිරි එකතු කිරීමේ වාහනය ලබාගෙන ඒ වෙනුවට ජල බවුසරයක් 2021 ජූලි 16 දින භාරදී තිබූ නමුත්, එම ජල බවුසරයේ වටිනාකම ගිණුම්වලින් ඉවත් කර සහ ලැබී තිබූ කිරි එකතු කිරීමේ වාහනයේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල නියමිත ගැලපීම් සිදු කර නොතිබුණි. | හුවමාරු කළ වත්කම්වල වටිනාකම් ඉදිරි වර්ෂයේ ගිණුම්වල ගැළපීමට තීරණය කර ඇති බව. | වාහනයේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකිරීමට පියවර ගත යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අලුත්වැඩියා කළ හැකි වාහන 06 ක් අළුත්වැඩියා කිරීමටත් පරිහරණය කළ නොහැකි වාහන 04 ක් සුදුසු පරිදි අපහරණය කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් ලැබූ පසුව අළුත්වැඩියා සිදු කරනු ලැබේ. එසේම, යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ වාර්තා ලබාගෙන ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | වාහන අළුත්වැඩියා කිරීමටත් පරිහරණය කළ නොහැකි වාහන අපහරණය කිරීමටත් පියවර ගත යුතුය. |
| (ආ) | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා මිලදී ගත් රු.1,082,500 ක් වටිනා Multishopper සහ Rotatable strainer යන්ත්‍ර පසුගිය වර්ෂ 02 සිට භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි. | අලි වැට ඉදිකිරීමෙන් පසුව යන්ත්‍ර භාවිතා කිරීමට පියවර ගැනීමට නියමිත බව. | වත්කම් භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සභාව විසින් සකස් කර නොතිබුණි. | මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට පියවර ගෙන ඇති බව. | සැපයුම් සහ මිලදී ගැනීම්/සේවා සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු සහ අතිරික්ත** | | |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්ය මණ්ඩල ලැයිස්තු ප්‍රකාරව, සභාවේ පැවැති තනතුරු 12ක් සඳහා පුරප්පාඩු 28ක් සහ අතිරික්තව සේවකයින් 04ක් විය. | මේ පිළිබඳව ඉහළ මට්ටමේ පරිපාලනයට දැනුම් දී තිබුණද මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව. | පුරප්පාඩු පිරවීමට සහ අතිරික්ත සේවකයින් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමර්ග ගැනීමත් සිදු කළ යුතුය. |
| **(ආ) සේවක ණය** | | |
| සභාවේ සේවකයන් 06කට ලබා දී තිබූ ආපදා ණය සහ වෙනත් ණය රු.503,195 ක් වර්ෂ 12ක සිට අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | තොරතුරු කිසිවක් නොමැති මෙම සේවකයින් පිළිබඳව සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා මාර්ගයෙන් නැගෙනහිර පළාත් පාලන කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි ඉදිරි කටයුතු කිරිමට නියමිත බව. | හිඟ සේවක ණය අයකිරීමට කටයුතු කළ යුතුය. |

## 4 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රයේ 08 වගන්තිය ප්‍රකාරව, පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPL) කල් ඉකුත් වීමට මාස 03කට ප්‍රථම අළුත්කිරිමට ඉල්ලුම් කළ යුතු වුවත්, ආයතන 44 ක බලපත්‍ර කල් ඉකුත්වී තිබූ නමුත් අළුත්කිරිමට පියවර ගෙන නොතිබුණි. | බලපත්‍ර අළුත්කිරිමට අපොහොසත් වීමේදී දඩ ගාස්තු අය කරනු ලබන බවත් දැනුම් දී ඇති බව. | පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත්කිරිමට පියවර ගත යුතුය. |